**රුහුණ විශ්වවිද්‍යාලය**

# දෙමළ, හින්දී, ප්‍රංශ, ජපන්, ජර්මන්, කොරියානු හා චීන භාෂා සහතිකපත්‍ර පාඨමාලා - 2021

## අයදුම්පත් කැඳවීම

රුහුණ විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ නූතන භාෂා හා ශිෂ්ටාචාර මධ්‍යස්ථානය මගින් මෙහෙයවනු ලබන ඉහත සඳහන් පාඨමාලා සඳහා **රුහුණ විශ්වවිද්‍යාලයේ ඕනෑම පීඨයක අභ්‍යන්තර උපාධි අපේක්ෂක සිසුන්ගෙන්** අයදුම්පත් කැඳවනු ලැබේ.

- අයදුම් කළ යුතු ආකාරය : **2021 ජුනි 07වන දින සිට නූතන භාෂා හා ශිෂ්ටාචාර මධ්‍යස්ථානයේ වෙබ් අඩවියෙහි (https://hss.ruh.ac.lk/MLU/about.html) පළවන ඒ ඒ භාෂාවට අදාළ සබැඳිය ඔස්සේ ලියාපදිංචි විය යුතු ය. නියමිත ශිෂ්‍ය ප්‍රමාණය සම්පූර්ණ වීමෙන් අනතුරුව එම සබැඳිය අක්‍රිය වේ. එක් ශිෂ්‍යයෙකුට ලියාපදිංචි විය හැක්කේ එක් භාෂා පාඨමාලාවක් සඳහා පමණි.**
- පාඨමාලාවේ කාල සීමාව : අවුරුදු 01යි. (සමාසික 02)
- ලියාපදිංචි වීමේ ගාස්තුව : රුපියල් 2000.00 **(ලියාපදිංචි වීමේ ගාස්තුව පමණක් අය කරනු ලැබේ)**
- **මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ මාර්ගගත ක්‍රමය (Zoom) මගිනි.**
- එක් පාඨමාලාවක් සඳහා අර්ඝ (credits) 15කි.
- අපේක්ෂිත ශිෂ්‍ය ප්‍රමාණය **: හින්දි භාෂාව සඳහා සිසුන් 200ක්** පමණක් බඳවාගනු ලබන අතර **අනෙකුත් සියලු භාෂා සඳහා සිසුන් 300** බැගින් බඳවා ගනු ලැබේ.
- පාඨමාලාවට අදාළ ලියාපදිංචි ගාස්තුව ඕනෑම **මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 032-1-001-1-2477589** යටතේ **රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට** බැරවන සේ ගෙවා ලබාගත් ලදුපතෙහි පිටපතක් (එහි මුල් පිටපත ඔබ සතු ව තබාගත යුතු ය) පසුව අප වෙත එවිය යුතු අතර (සංචරණ සීමා අවසන් වීමෙන් පසුව) ඒ පිළිබඳ ඉදිරියේදී දැනුම්දෙනු ලැබේ.

**සම්බන්ධීකාරක**

**කථිකාචාර්ය රන්ජනී මලවි පතිරණ**

**නූතන භාෂා හා ශිෂ්ටාචාර මධ්‍යස්ථානය**

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

**රුහුණ විශ්වවිද්‍යාලය**

2021.06.01

## විමසීම්

**කථිකාචාර්ය රන්ජනී මලවි පතිරණ - සම්බන්ධීකාරක (නූතන භාෂා හා ශිෂ්ටාචාර මධ්‍යස්ථානය)** ÷ 0773915886

**කථිකාචාර්ය සමිත උදයංග - සම්බන්ධීකාරක (දෙමළ භාෂාව)** ÷ 0702297348

**කථිකාචාර්ය කෝෂලී කැකුලන්දල - සම්බන්ධීකාරක (හින්දී භාෂාව)** ÷ 0713991950

**කථිකාචාර්ය ඇන් ජයසේකර සහ භාෂා උපදේශක චක්‍රංගි දහනායක - සම්බන්ධීකාරක (ප්‍රංශ භාෂාව)** ÷ 0710150347/0714292285

**ජ්‍යෙ.කථිකාචාර්ය ආචාර්ය දිල්ශාන් රාජපක්ෂ (ජර්මන් භාෂාව)** ÷ 0771245874

**ජ්‍යෙ.කථිකාචාර්ය ආචාර්ය රවිඳු අබේවර්ධන (ජපන් භාෂාව)** ÷ 0713057031

**ජ්‍යෙ.කථිකාචාර්ය ආචාර්ය විජේසිංහ - සම්බන්ධීකාරක (චීන භාෂාව)** ÷ 0716870362

**කථිකාචාර්ය ජයනි සමීරා - සම්බන්ධීකාරක (කොරියානු භාෂාව)** ÷ 0717665533